නැගෙනහිර පළාත් සභාව - 2017

-----------------------------------

නැගෙනහිර පළාත් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23 (2) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කෙරේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලව වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කලමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිලිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ජේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට නැගෙනහිර පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිලිබඳ අදහස් දැක්වීම.

---------------------------------------

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

(අ) පළාත් පාලන ආයතනය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී පළාත් සභාව විසින් රැස්කරන ලද එකතුව රු. 460,280,477 ක් වූ මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් මූල්‍ය ප්‍රකාශනවල වගකීම් ලෙස දක්වනවා වෙනුවට ආදායම් ලෙස දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය සඳහා අතිරික්තය එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) පළාත් සභාවට එරෙහිව තුන්වන පාර්ශවයන් විසින් අධිකරණයේ පවරන ලද නඩු 41 ක් සම්බන්ධයෙන් පැන නැගිය හැකි අසම්භාව්‍ය බැරකම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ඇ) නිදහස් දුම්රිය බලපත්‍ර සම්බන්ධයෙන් 2004 සිට 2015 වර්ෂය දක්වා කල්මුනේ කලාප අධ්‍යාපන කාර්යාලය විසින් ගෙවිය යුතු රු. 44,964,782 ක් වූ වටිනාකමක් බැදීම් සහ වගකීම් යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. තවද දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා 2016 හා 2017 වර්ෂ වෙනුවෙන් නිකුත්කළ නිදහස් දුම්රිය බලපත්‍ර වටිනාකම් වලට අදාළ වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට පළාත් සභාව සතු ස්ථාවර වත්කම් වශයෙන් රු. 7,056,523,854 ක වටිනාකමක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු නමුත් ඒවා සත්‍යාපනය සඳහා උපකාරි වන උප ලෙජරයන් හා විධිමත් පරිදි පවත්වාගෙන යා යුතු අනෙකුත් වාර්තා පවත්වාගෙන ගොස් නොතිබුණි.

2.3 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම

----------------------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසි වල විධිවිධාන වලට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| i. මුදල් රෙගුලාසි 138 | පළාත් රාජ්‍ය සේවා කොමිසමේ අදාළ සහතික කිරීමේ නිලධාරීන්ගේ සහතිකය නොමැතිව සමාලෝචිත වර්ෂයේ එකතුව රු.1,905,703 ක් වූ වවුචර් 86 ක් සඳහා ගෙවීම් කර තිබුණි. |
| ii. මුදල් රෙගුලාසි 237 (ආ) | ත්‍රිකුණාමලය කලාප සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව හා ග්‍රාමීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පිලිවෙලින් රු. 1,150,000 ක් රු. 725,100 ක් වූ භාණ්ඩ සඳහා සැපයුම් කිරීමට පෙර මුදල් ගෙවා තිබුණි. |
| ii. මුදල් රෙගුලාසි 396 | රු. 3,532,986 ක් වටිනා චෙක්පත් දෙකක් 2016 අගෝස්තු සිට 2017 මැයි දක්වා ත්‍රිකුණාමලය කලාප සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂක විසින් සැපයුම්කරුවන්ට නිකුත් කර තිබු අතර ඒවා 2018 ජුනි 30 දක්වා මාරු කර ගෙන නොතිබුණි. |
| iv. මුදල් රෙගුලාසි 571 | අමාත්‍යාංශ 01 ක හා දෙපාර්තමේන්තු 6 කට අදාළව වර්ෂ 2 ක කාලයක් ඉක්මවා පැවති. වටිනාකම රු. 16,052,213 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| v. | මුදල් රෙගුලාසි 756 | පළාත් පාසල් 432 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුල සිදුකල යුතු භාණ්ඩ සමීක්ෂණය 2018 ජුනි 30 දක්වා සිදුකර නොතිබුණි. |

(ආ) **නැගෙනහිර පළාත් මුදල් රීති (PER)**

| | | |
|---|---|---|
| i. | පළාත් මුදල් රීති 215 | අග්‍රිමයේ උපයෝජනය නොකළ ශේෂය ඊලග මුදල් වර්ෂයේ පළමු වැඩකරන දිනය තුල පළාත් භාණ්ඩාගාරයට ආපසු යැවිය යුතුය. කෙසේ වුවද පළාත් දෙපාර්තමේන්තු 2 ක එකතුව රු. 18,907,219 ක් වූ අග්‍රිම ශේෂය 2018 ජුනි 30 දින දක්වා පළාත් භාණ්ඩාගාරයට නිරවුල් කර නොතිබුණි. |
| ii. | පළාත් මුදල් රීති 326.2 | 2017 වර්ෂය අවසානයට පළාත් සභාවේ ඒකාබද්ධ ස්ථාවර වත්කම් උපයෝජන ප්‍රකාශනය 2018 අප්‍රේල් 30 දිනට හෝ ඊට පෙර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කල යුතුය. කෙසේ වුවද පළාත් සභාව විසින් එම ප්‍රකාශය පිළියෙළ කර 2018 ජුනි 30 දක්වා ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ පරිච්ජේද vii හි ජේද 10 (1) හා 10(2) වගන්ති | කින්නියා, මඩකලපුව මධ්‍යම හා කල්මුනේ පළාත් අධ්‍යාපන කාර්යාල බලප්‍රදේශවල පාසල් වල සේවයේ නියුතු ගුරුවරුන් 181 දෙනෙකුගේ වාර්ෂික වැටුප් වැඩිවීම් වසර 2 ක සිට වසර 11 දක්වා කාලයක් තුල ලබා දී නොතිබුණි. |

3. ආදායම් කලමනාකරණය

----------------------------

විගණනයට ලබා ගත හැකි වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ 4 ක් තුළ එකතු කරන ලද මුළු ආදායම් පහත දැක්වේ.

| විස්තරය | දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා | | | | |
|---|---|---|---|---|---|
| | 2017 | 2016 | 2015 | 2014 | 2013 |
| | රු.මි | රු.මි | රු.මි | රු.මි | රු.මි |
| බදු ආදායම | 3,178 | 2,896 | 2,347 | 2,181 | 1,860 |
| බදු නොවන ආදායම | 446 | 421 | 358 | 320 | 288 |
| එකතුව | **3,624** | **3,317** | **2,705** | **2,501** | **2,148** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය සඳහා පළාත් සභාව විසින් පිළියෙළ කරන ලද ආදායම් ඇස්තමේන්තුවට අනුව විවිධ ආදායම් යටතේ ඇස්තමේන්තු කරන ලද ආදායම රු. 7,000,000 ක් විය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ ඇස්තමේන්තු කරන ලද ආදායමෙන් සියයට 4 ක් නියෝජනය වන රු. 281,437 ක මුදලක් පමණක් එකතු කර තිබුණි.

(ආ) ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන යටතේ උසාවි විසින් නියම කරන ලද දඩ මුදල් වශයෙන් හා වත්කම් මාරු කිරීමේදී පළාත් සභාව විසින් ඉතිරිකිරීමේ ගිණුම්වල රඳවා ඇති ශේෂ සම්බන්ධයෙන් නියම කරන ලද මුද්දර ගාස්තු වශයෙන් රු. 311,351,736 ක මුදලක් පළාත් සභාව විසින් එකතු කරගෙන තිබුණු අතර ඒවා 2018 ජුනි 30 දක්වා අදාළ පළාත් පාලන ආයතන වලට මාරු කිරීමකින් තොරව පළාත් සභාවේ ඉතිරිකිරීමේ ගිණුම්වල රඳවා තිබුණි.

(ඇ) වරිපනම් කුලී, බලපත්‍ර ගාස්තු හා කල්බදු වැනි ප්‍රධාන ආදායම් ප්‍රභවයන් යටතේ රු. 466,231,688 ක මුදලක් 2018 ජුනි 30 දක්වා නැගෙනහිර පළාතේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන 45 ක් විසින් අයකර ගෙන නොතිබුණි.

(ඇ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ රජයේ දේපල මත තක්සේරුකළ බදු රු. 8,104,020 ක මුදලක් වසර 7 කට වැඩි කාලයක් පුරා හිඟ හිටිව පැවතුන අතර ඒවා 2018 ජුනි 30 දක්වා ත්‍රිකුණාමලය නගර සභාව විසින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක අදාළ රජයේ ඉඩම් සඳහා කල්බදු කුලී ආදායම වූ එකතුව රු. 273,080,657 ක් 1991 වර්ෂයේ සිට හිඟහිටි ශේෂයන් ලෙස පැවතුණි. කෙසේ වුවද එම නිසා ආදායම් අයකර ගැනීම සඳහා 2018 ජුනි 30 දක්වා නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) නැගෙනහිර පළාත් සභාවේ 2008 අංක 1 දරන මුල්‍ය ප්‍රඥප්තිය ප්‍රකාරව නැගෙනහිර පළාත් සභාවට අයත් ඕනෑම ආයතනයක් විසින් එකතු කරන ලද ආදායම පළාත් අරමුදලට ප්‍රේෂණය කළ යුතුය. කෙසේ වුවද ප්‍රධාන ලේකම් කාර්යාලයේ විෂය පථයට ගැනෙන ආයතන විසින් 2010 සිට 2014 දක්වා කාලපරිච්ඡේදය තුළ විවිධ ආදායම් ප්‍රභවයන්ගෙන් රැස්කරන ලද එකතුව රු. 5,640,753 ක් වූ ආදායම පළාත් අරමුදලට ප්‍රේෂණය කිරීමකින් තොරව විවිධ තැන්පතු ගිණුම් තුල රඳවා ගෙන තිබුණි.

(උ) නැගෙනහිර පළාත් සභාව පිහිටුවා වසර 30 ක් ගතවී තිබුණද නැගෙනහිර පළාතේ ක්‍රියාත්මක වන උකස් මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම හා ඒ සම්බන්ධයෙන් වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම සඳහා ප්‍රඥප්තියක් පනවා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සැලකිය යුතු ආදායම් ප්‍රමාණයක් පළාත් සභාවට අහිමි වී තිබුණි.

4. මුල්‍ය සමාලෝචනය

----------------------

4.1 මුල්‍ය ප්‍රතිපල

---------------

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභාවේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු. 2,434,433,298 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,613,477,971 ක් වුයෙන්, මුල්‍ය ප්‍රතිඵලයේ රු. 820,955,327 ක වර්ධනයක් දැක්වුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු රැස් කිරීම රු. 440,508,699 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

4.2 විග්‍රහත්මක මූලා සමාලෝචනය

-----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභාවේ මුළු වියදම රු. මිලියන 23,209 ක් වූ අතර ඉන් රු. මිලියන 22,052 ක මුදලක් පුනරාවර්තන වියදම් සඳහා දරා තිබුණි. එය මුළු වියදමෙන් සියයට 95 ක් නියෝජනය විය. මුළු පුනරාවර්තන වියදමෙන් රු.මිලියන 17,794 ක මුදලක් පුද්ගල පඩිනඩි සඳහා දරා තිබුණු අතර එය මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 81 ක් විය. ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම රු.මිලියන 16,292 ක් වූ අතර එය එම වර්ෂය සඳහා මුළු වියදමෙන් සියයට 80 ක් නියෝජනය විය.

4.3 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

4.3.1 කාර්යසාධනය

----------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට අනුව පළාත් රාජ්‍ය සේවා කොමිසම විසින් නැගෙනහිර පළාත් සභාව යටතේ ඇති ආයතන වල නිලධාරින් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග 13 ක් පැවැත්විය යුතු විය. කෙසේ වුවද කාර්යක්ෂමතා කඩඉම් විභාග 05 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ පවත්වා තිබුණි.

(ආ) පළාත් නිවාස සංවර්ධන අධිකාරිය විසින් 2015-2019 කාල සීමාව සඳහා පිළියෙළ කර තිබූ නිවාස සංවර්ධන සැලැස්ම අනුව නිවාස අහිමි පවුල් සඳහා සමාලෝචිත වර්ෂය තුල රු.මිලියන 2,937 ක් වැයකර නිවාස 6000 ක් සෑදීමට සැලසුම් කර තිබුණි. එසේ වුවද පළාත් විශේෂිත සංවර්ධන ප්‍රදානයන් යටතේ ප්‍රතිලාභීන් 66 දෙනෙකු සඳහා නිවාස සෑදීමට අවශ්‍ය සහය ලබා දීම සඳහා රු. 7,380,000 ක් වැය කිරීම හා හඳුනාගත් නිර්ණායකයන් පදනම්ව ප්‍රතිලාභීන් 118 දෙනෙකු සඳහා රු. 5,300,956 ක් වූ නිවාස ඉදිකිරිම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා දීම හැර සමාලෝචිත වර්ෂය තුල වෙනත් නිවාස ඉදිකිරීමක් සිදු කර නොතිබුණි.

4.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 1885/38 හා 2014 ඔක්තෝම්බර් 23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යවස්ථාවට පටහැනිව, ශ්‍රී ලංකා ගුරු සේවයට අයත් ගුරුවරුන් 74 දෙනෙකු වසර 04 සිට වසර 30 දක්වා කාලච්ඡේදයක් පුරා අදාල බලධාරීන් විසින් ඔවුන්ගේ සේවය ස්ථිර කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රක්ෂණ ආවරණය ආදායම් බලපත්‍රය ලබා නොතිබූ පළාත් රාජ්‍ය සේවා කොමිසමට අයත් වාහනයක් 2017 ජූනි මස 04 වෙනි දින අනතුරකට භාජනය වී තිබුණි. එසේ වුවද රක්ෂණය නොකිරීම හා ආදායම් බලපත්‍රය ලබා නොගැනීම සම්බන්ධයෙන් වගකීම පැවරීම පිණිස මේ පිලිබඳ විමර්ශනයක් සිදුකර නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම වාහන අලුත්වැඩියා කර ගැනීමට නොහැකිව 2018 ජූනි 30 දින දක්වා පෞද්ගලික ගරාජයක නිශ්ක්‍රියව පැවතුණි.

(ඇ) නැගෙනහිර පළාතේ ඉඩම් ලියාපදිංචි කිරීමේදී අයකරන මුද්දර ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ පැවැත්වූ ජංගම සේවයට අනුව ඉඩම් හිමියන් 93 දෙනෙකු මුද්දර ගාස්තු අඩුවෙන් ගෙවීමේ පරමාර්ථයෙන් තම ඉඩම්වල වටිනාකම අඩුවෙන් පෙන්වා තිබුණි. ඒ අනුව මෙම අඩු වටිනාකමෙන් තක්සේරු කල ඉඩම් සඳහා රු.5,877,568 ක් වූ අතිරේක මුද්දර ගාස්තු වටිනාකමක් පනවා තිබුණි. එසේ වුවද පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2018 ජූලි 30 දින දක්වා මෙසේ අතිරේකව පැනවූ මුද්දර ගාස්තු අදාළ ඉඩම් හිමියන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ඉඩම් අවතක්සේරු කිරීම සම්බන්ධයෙන් අමතර මුද්දර ගාස්තු පැනවීම හා ඒවායේ සත්‍යතාවය පරික්ෂා කිරීම පිණිස වර්ෂ 2012 සිට 2017 කාල සීමාව තුළ නැගෙනහිර පළාතේ ලියාපදිංචි වී තිබූ ඔප්පු 9818 ක් නැවත තක්සේරු කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 7 (2) (සී) ඡේදය ප්‍රකාරව පළාත් සභා විසුරුවා හැරීමේදී එම විසුරුවා හැරීමෙන් පසුව කඩිනමින් පැවැත්වෙන පළමු රැස්වීම දක්වා සභාපතිවරයාගේ තනතුර අත් නොහැරේ. ඒ අනුව පළාත් සභා විසුරුවා හැරීමෙන් පසුවද සභාපතිවරයාට පමණක් අදාළ තනතුර සඳහා කෙරෙන ගෙවීම් ලබා ගැනීමට හිමිකම් ඇත. කෙසේ වුවද 2017 සැප්තැම්බර් 30 නැගෙනහිර පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසු සභාපතිවරයාගේ පෞද්ගලික කාර්යය මණ්ඩල සඳහාද 2017 ඔක්තෝබර් හා නොවැම්බර් මාස වෙනුවෙන් රු. 1,045,112 ක මුදලක් පළාත් සභාව විසින් වැඩිපුර ගෙවා තිබුණි.

(ඊ) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජෙනරාල්ගේ අංක 2/2011 හා 2011 පෙබරවාරි 24 දිනැති චක්‍රලේඛය පරිදි තාවකාලික හා අනියම් කාර්යය මණ්ඩල වෙනුවෙන් වන දායකත්වය රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදලට මාරු කළ යුතුය. කෙසේ වුවද කාත්තන්කුඩි හා එරාවූර් නගර සභාවන්හි පිලිවෙලින් 77 ක් හා 73 ක් වූ කාර්ය මණ්ඩලය වෙනුවෙන් 2015, 2016 හා 2017 වර්ෂය සඳහා ඔවුන්ගේ වැටුප් වලින් අදාළ දායකත්වය අඩුකර ගෙන නොතිබුණි.

(උ) පළාත් සභාවේ දෙපාර්තමේන්තු 9 ක කාර්ය මණ්ඩලය වෙනුවෙන් ගෙවන ලද ණය අත්තිකාරම් වෙනුවෙන් වූ රු. 1,595,036 ක් වූ ශේෂයන් වසර 2 සිට 13 දක්වා අය නොවී පැවති අතර ඒවා අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඌ) මඩකලපුව මහ නගර සභාවේ පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරිම සඳහා ඇස්තමේන්තු කල පිරිවැය වූ රු. 195,000,000 ක මුදලින් රු. 74,752,383 ක් වර්ෂ 2011 සහ 2013 කාලච්ඡේදය තුළ වැයකර තිබුණි. එසේ වුවද පළාත් සභාව විසින් මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නිමකිරීමට වසර 4 ක කාලයක් තුළ නොහැකි වී තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පුස්තකාල පහසුකම් ලබා ගැනීමේ අවස්ථාව මගහැරී තිබූ අතර මෙම ඉදිකිරීමේ ඇස්තමේන්තු වටිනාකමද රු. 195,000,000 සිට රු. 207,000,000 දක්වා සියයට 6 කින් වැඩි වී තිබුණි.

(එ) කාත්තන්කුඩි නගර සභාව වෙත 1992 වර්ෂයේදී වටිනාකම රු. 600,000 ක් වූ රෝද හතරේ ට්‍රැක්ටරයක් පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණි. එය 2014 වර්ෂය දක්වා පාවිච්චි කර තිබූ අතර 2012 වර්ෂයේදී එය අලුත්වැඩියා කිරීම සඳහා රු. 315,203 ක් වැයකර තිබුණි. .එසේ වුවද මෙම ට්‍රැක්ටරය අංක 02/2015 හා 2015 මැයි 10 දිනැති රාජ්‍ය මුදල්

චක්‍රලේඛයට පටහැනිව 2016 ජූලි 02 දින සභාවේ ලේකම්වරයා විසින් රු. 16,150 ක් වූ මිලකට වෙන්දේසියේ විකුණා තිබුණි.

(ඒ) අංක 25/2014 හා 2014 නොවැම්බර් 12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි, ප්‍රතිපාදන අනුමත කිරීම හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගැනීම යන අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් තොරව කාත්තන්කුඩි හා එරාවූර් යන නගර සභාවන්හි අනුමත කාර්යය මණ්ඩලය නිලධාරීන් 49 දෙනෙකුගෙන් ඉක්මවා තිබියදී 2015, 2016 හා 2017 යන වර්ෂයන්හිදී හිටපු ප්‍රධාන අමාත්‍යවරයාගේ ඉල්ලීම පරිදි සේවකයන් 150 දෙනෙකු කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගෙන තිබුණි. තවද, මෙම නගර සභාවේ 28 ක් වූ අනියම් සේවකයන්ද ඇතුළුව සේවකයන් 58 දෙනෙකු නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන පුස්තකාල 05 කට සහ කියවීම් ශාලා 4 ක් සඳහා අනුමත කාර්යමණ්ඩලය 14 දෙනෙකු පමණක් අනුමතව තිබියදී බඳවා ගෙන තිබුණි.

(ඔ) යල් පැනගිය පරිගණක හේතුවෙන් අක්කරෙයිපත්තු කළාප අධ්‍යාපන කාර්යාලයේ පවත්වාගෙන එනු ලැබූ පරිගණක සම්පත් ආයතනය 2015 ඔක්තෝබර් 01 දින සිට අක්‍රියව පැවතුණි. එහි ප්‍රතිපලයක් ලෙස ගුරුවරුන්ට හා ශිෂ්‍යයින්ට තොරතුරු තාක්ෂණය පාඨමාලා හා පුහුණුවීම් අවස්ථා ලබා ගැනීමට තිබූ අවස්ථාව මගහැරී තිබූ අතර එම ආයතනයේ පැවති ලි බඩු හා උපකරණ වසර 2 කට වැඩි කාලයක් තිස්සේ නිශ්ක්‍රියව පැවතුණි.

(ඕ) සභාවට අයත් ඉඩම් බාහිර පාර්ශව වෙත ලබා දීමට සභාපතිවරයාට අධිකාරි බලයක් නොමැති වුවද ත්‍රිකුණාමලය මහනගර සභාව සතු ඉඩම් එසේ පෞද්ගලික අංශයට ලබා දී තිබුණි. ඒ අනුව සභාව සතුව තිබූ පර්චස් 3212 ක ප්‍රමාණයක් හිටපු සභාපතිවරයා විසින් 2008 වර්ෂයේදී පුද්ගලයින් 576 දෙනෙකුට ලබා දී තිබුණි.

(ක) කල්මුනේ අධ්‍යාපන කලාපයේ කරතිව් හි පිහිටි පාසලක තාක්ෂණික ගොඩනැගිල්ලකට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සපයා තිබූ පරිගණක 42 කින් පරිගණක 8 ක් සම්පූර්ණයෙන්ම විනාශ වී තිබුණු අතර මුහුදු සීමාවේ සිට මීටර් 208 ක් දුරින් පිහිටා තිබූ මෙම ගොඩනැගිල්ලට වූ මුහුදු සුළගේ බලපෑම නිසා ඉතිරි පරිගණකද අර්ධ වශයෙන් හානියට පත් වී තිබුණි.

(ග) පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශයට අයත් වාහනයක් සඳහා 2016 මාර්තු 15 දින රක්ෂණ ආවරණයක් ලෙස රු. 1,500,000 ක් පළාත් භාණ්ඩාගාරය වෙත ලැබී තිබුණි. කෙසේ වුවද මෙම මුදල අදාළ වාහනයේ අලුත්වැඩියා කටයුතු සඳහා යොදවා ගැනීම

වෙනුවට 2017 දෙසැම්බර් 11 දින පළාත් ආදායමට බැර කර තිබුණි. කෙසේ වුවද මෙහි ප්‍රතිඵලයක් වශයෙන් අදාළ වාහනය 2016 මාර්තු 15 දින සිට නිශ්ක්‍රියව පැවතුණි.

(ට) පළාත් සභාව තුළ වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු 6 ක් පැවති අතර ඉන් අත්තිකාරම් ගිණුම් කටයුතු 3 ක් අවුරුදු 8 ක කාල සීමාවක සිට ක්‍රියාත්මක වී නොපැවතුණි. එසේ වුවද පළාත් මුල්‍ය රෙගුලාසි 286 අනුව එම අත්තිකාරම් ගිණුම් කටයුතු 3 වසා දැමීමට කටයුතු කර නොතිබුණි.

4.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ I (අ) ශ්‍රේණියට පත්කිරීමේදී අංක 1885/38 හා 2014 ඔක්තෝබර් 23 දිනැති ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යවස්ථාවේ 7.2.4.1 ජේදය අනුව ලබා ගත යුතු අනෙකුත් සුදුසුකම් වලට අමතරව හැකියාවන් පිලිබඳ කෙරෙන පරීක්ෂණය හා සාමාන්‍ය දැනීමේ විෂයයන් යන දෙකම සඳහා අවම වශයෙන් ලකුණු 40 ක් ලබා ගත යුතුය. එසේ වුවද පළාත් රාජ්‍ය සේවා කොමිසම විසින් පවත්වන ලද ලිඛිත පරික්ෂාවේදී ලකුණු 40 ක් ලබා ගැනීමට අසමත් වූ අයදුම්කරුවන් 180 දෙනෙකු සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිසම විසින් පත්වීම් ලබා දී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ 1 (ඇ) ශ්‍රේණියට ගුරුවරුන් බඳවා ගැනීම අංක 1885/38 හා 2014 ඔක්තෝබර් 23 දිනැති ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යවස්ථාවේ 7.2.4 ජේදය අනුව ලිඛිත තරග විභාගයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයක් මත සිදුවිය යුතුය. එසේ වුවද ගුරුවරුන් 314 දෙනෙකු අදාළ සේවා ව්‍යවස්ථාවට පටහැනිව ලිඛිත තරග විභාගයක් පැවැත්වීම වෙනුවට ඉංග්‍රීසි විෂය ඉගැන්වීම සඳහා වාචික පරීක්ෂණයක් මත 2017 නොවැම්බර් 27 හා 2018 මාර්තු මස බඳවාගෙන තිබුණි.

(ඇ) අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 16/2010 හා 2010 අප්‍රේල් 23 දිනැති චක්‍රලේඛයේ 02 ජේදය අනුව වාර විභාග සඳහා ප්‍රශ්න පත්‍ර සැකසීම පාසැල විසින්ම සිදුකළ යුතුය. එසේ වුවද කින්නියා සහ මඩකලපුව මධ්‍යම අධ්‍යාපන කලාප වල දෙවන හා තුන්වන වාර විභාග සඳහා සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශ උපදෙස් වලට පටහැනිව රු. 4,017,700

ක මුදලක් ශිෂ්‍යයන්ගෙන් එකතුකර තිබූ අතර එම මුදලින් රු. 474,593 මුදලක අතිරික්තයක් පැවතුණි.

(ඈ) අපිරිසිදු ජලය පිරිසිදු කිරීම හා ඒවා පරිසරයට මුදා හැරීමේදී පරමාර්ථයෙන් 2014 වර්ෂයේදී රු. 4, 044,907 ක පිරිවැයක් දරමින් මළ ප්‍රවාහන පද්ධතියක් ඉදිකර තිබුණි. එසේ වුවද එහි අත්‍යවශ්‍ය අංගයක් වූ කොහුකෙදි ඇතිරීමේ කාර්ය ඉටුකර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් පිරිපහදු හරිහැටි ක්‍රියාත්මක නොවී අපිරිසිදු ජලය පරිසරයට එකතු වීමේ තත්ත්වයක් ඇති වී තිබුණි. ඒ අනුව අපිරිසිදු ජලය පරිසරයට එකතු වීමෙන් පරිසර විනාශයක් ඇති වීම නිසා එම ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබුණු අතර ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද වියදම ඵලදායි නොවන බව නිරීක්ෂණය විය.

(ඉ) ගුරු පුරප්පාඩු පවතින පාසල් තිබියදී කින්නියා සහ මඩකලපුව මධ්‍යම කලාප අධ්‍යාපන කාර්යාලවලට අයත් පාසල් වලට සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් හා ගුරු උපදේශකවරුන් 63 ක් අනුමත කාර්යමණ්ඩලය ඉක්මවා බඳවාගෙන තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ පරිච්ඡේද II හි 13.3 ඡේදය අනුව වැඩ ආවරණය කිරීමේ පත්වීමක් ලබා දිය යුත්තේ තාවකාලිකව පිළියමක් වශයෙන් වන අතර එය ආදේශක පත්වීමක් ලබාදෙන තෙක් විය යුතුය. එසේ වුවද පළාත් සභාවේ පැවති පුරප්පාඩු වල වැඩ ආවරණය කිරීමේ පදනමින් දීපව්‍යාප්ත සේවාවලට අයත් නිලධාරින් විසි දෙදෙනෙකු පත්කර තිබුණු අතර මාස 6 කට වැඩි කාලයක සිට මේ සඳහා ස්ථිර කාර්යමණ්ඩලය පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

4.6 හඳුනාගන්නා ලද පාඩු

------------------------

කාන්තන්කුඩි නගර සභාවට අයත් පුස්තකාල ගොඩනැගිල්ල තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මාසික කුලිය රු. 125,000 කට තක්සේරු කර තිබුණු නමුත් එය මාසික කුලිය රු. 5,000 කට පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම පිණිස වසර 4 ක කාලයක් සඳහා බඳු දී තිබීම නිසා සභාව වෙත රු. 4,755,000 ක අලාභයක් සිදු වී තිබුණි.

4.7 නැවත නැවතත් සිදුවන ස්වභාවයේ ගනුදෙනු

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නැගෙනහිර පළාතේ ලෝක බැංකු ආධාර මත සිදු කෙරුණු මාර්ග ඉදිකිරීමේ කටයුතු වල යෙදුණු පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකුට රු. 87,422,148 ක මුදලක් වන්දියක් ලෙස ගෙවීමට නැගෙනහිර පළාත් සභාවට සිදුවී තිබුණි. තවද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ කාල පරිච්ඡේදය තුළ අදාළ ගැටළුව නිරාකරණය කර ගැනීමේ ක්‍රියාවලියේදී පළාත් සභා අරමුදලින් රු. 6,680,171 ක අතිරේක මුදලක් නීති ගාස්තු වශයෙන් නීතිඥවරු කිහිප දෙනෙකු වෙත ගෙවීමට සිදු වී තිබුණි.

(ආ) අදාළ ගැටළුව නිරාකරණය කර ගැනීමේ ක්‍රියාවලියේදී මෙම කාලය තුල අංක 42 හා 1987 පළාත් සභා පනතේ 13 වන සංශෝධනය අනුව, පළාත් සභාවේ සභා නායක තනතුර හා විපක්ෂ නායක යන තනතුරු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. කෙසේ වුවද පළාත් සභාව විසින් එම තනතුරු දෙක ඇතිකර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 1,172,525 ක් දීමනා වශයෙන් ගෙවා තිබුණි.

(ඇ) මඩකලපුව කළාප අධ්‍යාපන කාර්යාලය යටතේ ඇති කරුවපෙත්කර්නි විපුලානන්ද විද්‍යාලයේ මහල් දෙකකින් යුත් පංති කාමර ගොඩනැගිල්ලක් මහල් දෙකකින් යුත් විද්‍යාගාරයක් හා පුස්තකාලයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා ඉටු නොකරන ලද වැඩ කොටස් වෙනුවෙන් රු. 4, 201, 942 ක මුදලක් අදාළ කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

4.8 අරමුදල් උපයෝජනය

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සභාව විසින් පළාත් පාලන ආයතනය වෙනුවෙන් අයකරන ලද මුද්දර ගාස්තු අදාළ පළාත් පාලන ආයතන වලට මාරු කිරීම වෙනුවට වසර 8 ක් පුරා බැංකු ගිණුමක රඳවා ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂ 2010 සිට 2017 කාලච්ඡේදය තුළ රු.මිලියන 12 සිට රු,මිලියන 62 ක මුදල් නිශ්ක්‍රියව බැංකු ගිණුමක රඳවා තිබුණි.

(ආ) පළාත් සභාවට අයත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 09 කට අදාළ 2017 වර්ෂයේදී ප්‍රාග්ධන ව්‍යාපෘතිවලට අයත් වැය විෂයන් 24 ක් සඳහා ප්‍රතිපාදන රු. 38,231,216 ක මුදලක් අදාළ සංවර්ධන කාර්යයන් සඳහා ප්‍රයෝජනයට නොගෙන පැවතුණි.

4.9 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කින්නියා සිට ත්‍රිකුණාමලය දක්වා මඟී ප්‍රවාහනය සඳහා යොදාගත් පාරුවක් කාන්තන්කුඩි සිට කොක්කඩිචෝලේ දක්වා ප්‍රවාහන සේවා සැපයීම සඳහා 2012 වර්ෂයේදී රු. 323,550 ක් වියදම් කර කාන්තන්කුඩි ප්‍රදේශයේ පවත්වාගෙන යාමට කටයුතු කර ඇති අතර කාන්තන්කුඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින්ද මෙම පාරුව අලුත්වැඩියා කිරීම සඳහා රු. 489,500 ක් වියදම් කර තිබුනද එය 2018 ජුනි 30 දක්වා නිශ්ක්‍රියව පැවතුණි.

(ආ) පෞද්ගලික බස් රථ මඟී පර්යන්තය වෙත පැමිණීමේ හා පිටවීමේ වේලාවන් සටහන් කිරීම පිණිස නැගෙනහිර පළාත් මඟී ප්‍රවාහන අධිකාරිය විසින් ස්ථාන 13 කට දත්ත සම්ප්‍රේෂණ ගුවන් විදුලි සේවාවන් (GPRS) සම්බන්ධ කෙරෙන පද්ධතියන් සහ 2000 ක සංඛ්‍යාවක් වූ ටිකට් රෝල් ප්‍රමාණයක් 2015 ජුනි 8 දින රු. 1,142,000 වටිනාකමකට ලබාගෙන ස්ථාපිත කර තිබුණි. එසේ වුවද මෙම යන්ත්‍රය භාවිතා කිරීමට අවශ්‍ය සුදුසු මෘදුකාංගයක් නොමැති වීම නිසා අපේක්ෂා කල අරමුණු ඉටු කර ගැනීමෙන් තොරව වසර 3 කාලයක් නිශ්ක්‍රියව පැවතුණි.

(ඇ) ත්‍රිකුණාමලය මහා නගර සභාවට අයත් වෙළඳ කුටි 299 සංඛ්‍යාවකින් වෙළඳ කුටි 90 ක් 2011 වර්ෂයේ සිට නිශ්ක්‍රියව පැවතුණි. ඒ අනුව ආසන්න වශයෙන් රු. මිලියන 2 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ඈ) සෞඛ්‍ය හා පෝෂණ කටයුතු පිලිබඳ අමාත්‍යාංශයේ අංක 01/08 හා 2018 ජනවාරි 12 දිනැති චක්‍රලේඛය පරිදි භාවිතා නොකරන වාහන කිසිවක් ආයතන පරිශ්‍රය තුල තබා නොගත යුතු වේ. එසේ වුවද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් වාහන 15 ක් ත්‍රිකුණාමලය ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම්

අංශය පිහිටි පරිශ්‍රය තුළ වෙන්දේසි කිරීම හෝ අලුත්වැඩියා කිරීමෙන් තොරව මාස 2 සිට මාස 84 දක්වා කාලච්ඡේදයක් තුළ රඳවා තිබුණි.

(ඉ) නිධන්ගත වකුගඩු රෝගීන් (CKD) සැලකිය යුතු තරම් සංඛ්‍යාවක් වාර්තා නොවීම නිසා නින්දවූර් හා වාලච්චෙන මූලික රෝහල් වල රුධිර කාන්දු පෙරණ ඒකක පිහිටුවීමේ අවශ්‍යතාවයක් පැන නොනගින බව නිරීක්ෂණය වූ නමුත් මේ පිළිබඳ අවධානය යොමු නොකරමින් පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් මෙම රෝහල් දෙකක් සඳහා රුධිර කාන්දු පෙරණ සඳහා වූ උපකරණ හා ඒ සඳහා වන ඖෂධ වර්ග පිලිවෙලින් රු. 18,555,000 ක් හා රු. 6,147,426 ක වටිනාකමකට ප්‍රසම්පාදනය කිරීමට කටයුතු කර තිබුණි. මේ හේතුව නිසා මෙම උපකරණ හා ඖෂධ 2017 මාර්තු 22 සිට නිශ්ක්‍රියව පැවතුණි. මීට අමතරව පොතුවුල් හා තිරික්කෝවිල් මූලික රෝහල් සඳහා රු. 4,899,000 ක් වැයකර එක්ස්රේ යන්ත්‍ර 2 ක් මිලදී ගැනීමට කටයුතු කර තිබුණු නමුත් එම යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමට සුදුසු කාර්මික ශිල්පින් එම රෝහල්වල සේවයේ නොයෙදීම නිසා වසර 1 සිට වසර 5 කාලයක් පුරා ඒවා නිශ්ක්‍රියව පැවතුණි.

(ඊ) ත්‍රිකුණාමලය මහා නගර සභාව විසින් ඝන අපද්‍රව්‍ය අපහරණයේදී භාවිතාකරන භාජන 424 ක් රු. 1,859,500 මිලකට මිලදී ගෙන තිබුණු අතර එම උපකරණ වසර 1 සිට වසර 2 දක්වා කාලයක් තුළ භාවිතා නොකර නිශ්ක්‍රියව පැවතුණි. මේ සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා විසින් පැහැදිලි කර ඇති පරිදි එම භාජන වලින් 182 ක් බෙදාහැර ඇති බවත් ඉතිරි 242 ක් වූ භාජන අනාගතයේදී බෙදාහැරෙන බවට පැහැදිලි කර තිබුණි.

(උ) ත්‍රිකුණාමලය මහා නගර සීමාව තුල පිහිටි විරනගර්හි රෝහල විසින් ඉවත දමනු ලබන හානිකර රෝහල් අපද්‍රව්‍ය දහනය කිරීම සඳහා වීරනගර්හි දාහකයක් ස්ථාපිත කිරීම 2015 වර්ෂයේ ආරම්භ කර 2017 වර්ෂයේදී අදාළ කටයුතු නිමකර තිබුණි. මේ සඳහා රු. 4,230,155 ක වියදමක් දරා තිබුණු අතර මෙම දාහකය සඳහා විදුලිය සපයා ගැනීමට ඇති බාධාව නිසා වර්තමානයේදී එය නිශ්ක්‍රියව පැවතුණි.මෙහි ප්‍රතිඵලයක් වශයෙන් හානිකර රෝහල් අපද්‍රව්‍ය ත්‍රිකුණාමලය කින්නියා ප්‍රදේශයේ විවෘත බිම් ප්‍රදේශයට මුදා හැරීමට කටයුතු කර තිබුණි.

(ඖ) නැගෙනහිර පළාතේ සංචාරක කාර්යාංශය විසින් රු. 3,542,364 ක මිලකට මිලදී ගත් ලි බඩු උපකරණ එම කාර්යාංශය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් වසර 1 සිට 3 දක්වා කාලච්ඡේදයක් තුළ නිශ්ක්‍රියව පැවතුණි.

(එ) ශිෂ්‍ය ශිෂ්‍යාවන් 92 දෙනෙකු පමණක් සිටින කල්මුණේ අධ්‍යාපන කලාපයේ පිහිටි පාසලක මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාරයක් සඳහා පරිගණක 64 ක් ලබා දී තිබුණි. එම පරිගණක අතරින් අනෙකුත් උපකරණ සහිත පරිගණක 32 ක් අදාළ අරමුණ සඳහා යොදා ගැනීමෙන් තොරව 2014 නොවැම්බර 13 දින සිට නිශ්ක්‍රියව පැවතුණි.

(ඒ) කල්මුණේ අධ්‍යාපන කලාපයේ කරතිවු හි පිහිටි පාසලක් සඳහා 2007 අගෝස්තු 24 වන දින රාජ්‍ය නොවන සංවිධානයක් විසින් දෙමහල් ගුරු නිවාසයක් පරිත්‍යාග කර තිබුණු අතර එය භාවිතයට නොගැනීම නිසා නිශ්ක්‍රියව පැවතුණි.

(ඔ) කින්නියා කලාප අධ්‍යාපන කාර්යාල බල ප්‍රදේශයේ පාසල් 2 කට ලබාදුන් පරිගණක 24 ක් හා අනෙකුත් උපාංග හා පරිගණක පුටු 10 ක් වසර 7 කට වැඩි කාලයක් නිශ්ක්‍රියව පැවතුණි.

(ඕ) මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට විධායක ඉංජිනේරු කාර්යාලයක් ස්ථාපිත කිරීම සඳහා 2015 වර්ෂයේදී රු.953,909 ක පිරිවැයක් මුතූර් හි ගොඩනගන ලද මහල් 3 කින් යුත් ගොඩනැගිල්ල අදාළ අරමුණු වෙනුවෙන් භාවිතා කිරීමෙන් තොරව නිශ්කාර්යව පැවතුණි.

4.10 කොන්ත්‍රාත් පාලනය

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උතුරු නැගෙනහිර ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතිය (NELSIP) යටතේ එරාවුර් නගර සභාවේ දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2013 වර්ෂයේදී රු. මිලියන 40 ක මුදලක් ලබා දී තිබුණි. කෙසේ වුවද මෙම දෙමහල් ගොඩනැගිල්ල සඳහා අනුමත කරන ලද මුල් සැලැස්ම හා ඇස්තමේන්තුව නගර සභාව විසින් ප්‍රතික්ෂේප කර තිබූ අතර ඒ වෙනුවට රු.මිලියන 110 කට තෙමහල්

ගොඩනැගිල්ලක් සෑදීම සඳහා වෙනත් සැලැස්මක් පිළියෙළ කර තිබූ අතර ව්‍යාපෘතිය වෙනුවෙන් ඇතිකර තිබූ සම්පූර්ණ ප්‍රතිපාදන එහි බිම් මහල ඉදිකිරිම සඳහා වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. පළාත් පාලන අමාත්‍යාංශය හා පළාත් සභාව විසින් මෙම ඉදිකිරිම සඳහා රු. මිලියන70 ක් 2013 සිට 2016 වර්ෂය දක්වා කාල සීමාව තුල අවස්ථා 3 කදී රු.මිලියන 35 බැගින් නිදහස් කර තිබුණි. කෙසේ වුවද සභාව විසින් මුදල් නිදහස් කරනු ලැබූ එක් එක් අවස්ථා වලදී වෙන වෙනම සැලැස්මක් ඉදිරිපත් කර තිබූ අතර අමාත්‍ය මණ්ඩල ටෙන්ඩර් මණ්ඩලයකින් අනුමත කර ගැනීමේ අවශ්‍යතාවය මගහරිමින් සම්පූර්ණ ගොඩනැගිල්ල ඉදිකිරිම සඳහා එක් කොන්ත්‍රාත්තුවක් ලෙස ලබාදීම වෙනුවට කොන්ත්‍රාත් 3 ක් යටතේ ලබා දී තිබුණි.

ii. 2017 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් මෙම ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ කරගෙන යාම පිණිස රු.මිලියන 21 ක අමතර ප්‍රසම්පාදනයක් ලබා දී තිබුණි. සභාව විසින් මෙම අරමුණින් වෙනත් ඇස්තමේන්තුවක් හා ප්‍රමාණ පත්‍රයක් පිළියෙළ කර තිබූ අතර ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය කිරීමෙන් තොරව වෙනත් කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. කෙසේ වුවද 2017 අගෝස්තු 19 දින කොන්ත්‍රාත්තුවේ වැඩ නිම වී පැවතියද කිසිදු වටිනාකමක් අයකර ගැනීම පිණිස කොන්ත්‍රාත්කරු විසින් බිල්පත් ඉදිරිපත් කර නොතිබුණි.

iii. සභාව විසින් සමස්ථ ඉදිකිරිම සම්පූර්ණ කර ලීම පිණිස එම කොන්ත්‍රාත්තුව වෙනුවෙන් එහි මුළු බිම් ප්‍රමාණය වූ වර්ග මීටර් 1683 ක් වෙනුවෙන් එදිනට රු. 89,465,726 ක මුදල් ගෙවා තිබියදී වෙනත් කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි.

iv. මෙම ගොඩනැගිල්ල ඉදිකිරිම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය හා මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් ලබා ගත යුතු මූලික අනුමැතිය ලබාගෙන නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් අදාළ ආයතනය විසින් මෙයට එරෙහිව නීතිමය පියවර ගැනීම නිසා සභාවට දඩ මුදල් ගෙවීමට සිදු වී තිබුණි. මෙහිදී මෙම ගොඩනැගිල්ලේ අධීක්ෂණ කටයුතු හා කල වැඩ සහතික කිරීමේ නිලධාරියා වන්නේ නියෝජ්‍ය ප්‍රධාන

ලේකම් (ඉංජිනේරු) වරයා විය. කෙසේ වුවද හිටපු ප්‍රධාන අමාත්‍යවරයාගේ උපදෙස් මත මඩකලපුව කලාප අධ්‍යාපන කාර්යාලයට අනුයුක්තව සිටි ඉංජිනේරු වරයකු මේ සඳහා පත්කර තිබුණි.

(ආ) ප්‍රධාන ලේකම් කාර්යාලය පිහිටි පරිශ්‍රය තුල සහා ලේකම් කාර්යාලය සඳහා මහල් හතරකින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරිම සඳහා නැගෙනහිර පළාත් සභාව විසින් අනුමැතිය ලබා දී තිබුණි. පිරිවැය රු. මිලියන 250.8 ක් වූ මෙම ගොඩනැගිල්ල සඳහා 2017 මාර්තු 15 දිනැතිව නිකුත් කර ඇති 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 33 ඇමුණුම අනුව අමාත්‍ය මණ්ඩලය ප්‍රසම්පාදන මණ්ඩලයක් විසින් මේ සඳහා අනුමැතිය ලබා දිය යුතුව තිබු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) එරාවුර් පිහිටි පාසලක් සඳහා තාක්ෂණික හා උපදේශන ඒකකයක් පිහිටුවීම පිණිස පිරිවැය රු.මිලියන 18 ක් වටිනාකමින් වූ මහල් 3 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරිම පිණිස නාගරික සංවර්ධන අධිකාරියේ හා මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතියකින් තොරව ලබා දී තිබුණු අතර මෙම ගොඩනැගිල්ල මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගයේ මාධ්‍ය රේඛාවේ සිට මීටර් 12 ක් හා එරාවුර් නගර සභාවට අයත් මාර්ගයේ මාධ්‍ය රේඛාවේ සිට මීටර් 4.9 ක් වශයෙන් වූ පිහිටීමක තිබුණි. ඒ අනුව අනුමැතියක් නොමැතිව ඉදිකරන ලද ගොඩනැගිල්ලක් වීමෙන් අදාළ අධිකාරි බලය ලත් ආයතනය විසින් යම් විටෙක නීතිමය පියවර ගැනීමට කටයුතු කල හොත් සභාවට ඒ සඳහා දඩ මුදල් ගෙවීමට සිදුවිය හැකිව තිබුණි.

(ඈ) මුළු පිරිවැය රු. 149,880,000 වැය කරමින් ඉදිකරමින් පැවති නැගෙනහිර පළාත් සභා ලේකම් කාර්යාලය 2016 මැයි 30 දිනට ඉදිකිරීම් කටයුතු නිමකිරීමට තිබියදී එම කාල සීමාව තුල එම ඉදිකිරීම් කටයුතු නිම කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වී තිබුණි. මෙම ප්‍රමාදය සම්බන්ධයෙන් පළාත් සභාව විසින් මේ සඳහා අත්සන් කරන ලද රු. 2,808,000 ක් වූ කාර්ය සාධන බැඳුම්කරය මගින් අදාළ ප්‍රමාද ගාස්තු අයකර ගැනීම පිණිස 2016 නොවැම්බර් 04 දිනවන විට කටයුතු කර නොතිබුණි. තවද දින 93 ක් වූ ඉදිකිරීම් ප්‍රමාදය වෙනුවෙන් රු. 1,

305, 491 ක් වූ නුබුන්වත් අලාභ අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ඉ) පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කින්නියා කලාප අධ්‍යාපන කාර්යාල බලප්‍රදේශය තුල පිහිටා ඇති (ශිෂ්‍ය ශිෂ්‍යාවන් 66 දෙනෙකුගේ ප්‍රයෝජනය පිණිස) කින්නියා ප්‍රදේශයේ පාසලක රු.මිලියන 23.6 ක් වූ පිරිවැයකට තාක්ෂණික ගොඩනැගිල්ලක් ඉදිකිරිම සඳහා කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. එසේ වුවද අදාළ ඉදිකිරීම් කටයුතු 2018 මාර්තු 23 දක්වා නිමකිරීමට නොහැකි වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ශිෂ්‍යයින් විසින් සම්පූර්ණ කල යුතු අනිවාර්ය ප්‍රයෝගික පුහුණුවීම් 66 කින් 10 ක් පමණක් සම්පූර්ණ කිරීමට හැකි වී තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් Tissue Culture rack එකක්, Inoculating Needle 4 ක් , Seri bed Sterilizer එකක් සහ Distillation Unit එකක්, භාවිතයෙන් තොරව නිශ්ක්‍රියව පැවතුණි.

(ඊ) මඩකලපුව මධ්‍යම අධ්‍යාපන කලාපයේ කාත්තන්කුඩි හි පිහිටි පාසලක ශිෂ්‍ය ශිෂ්‍යාවන් 459 දෙනෙකුට ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි රු. 11,145,438 ක් පිරිවැය වූ ගොඩනැගිල්ලක් ඉදිකිරීමේදී එම පාසල හරහා ඇති ඇල, පාසලට අයිති එකක් බව හැඟවෙන පරිදි ව්‍යාජ ලෙස සැකසූ ඔප්පුවක් පදනම් කර ගනිමින් අදාළ ඉදිකිරීම් කටයුතු සිදුකර තිබූ අතර එහිදී එහි ජලය අවහිර වීම වැනි කරුණු නොසලකා හරිමින් නාගරික සංවර්ධන අධිකාරියේ හා මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතියකින් තොරව අදාළ ඉදිකිරීම් සිදු කර තිබුණි. මෙම ඉදිකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ජල නල අවහිරවීමෙන් මදුරු ගහනය වර්ධනය වන ස්ථානයක් බවට පත් වී තිබුණි.

(උ) නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය විසින් එරාවූර් නගර සභාව වෙත පිරිවැය රු. මිලියන 193 ක් වූ තෙමහල් වෙළඳ සංකීර්ණයක් සඳහා අවශ්‍ය අරමුදල් සම්පාදනය කිරීම සඳහා එකඟත්වය පල කර තිබුණු අතර නැගෙනහිර පළාත් සභාවේ ලේකම් විසින් 2016 වර්ෂයේදී රු. 99,939,468 ක කොන්ත්‍රාත් වටිනාකමක් යටතේ ඉදිකිරීම් සිදු කිරීමට එකඟ වී තිබුණි. මෙම වෙළඳ සංකිර්ණය සඳහා ලබා ගත් ඉඩම එරාවූර් පිහිටි මුස්ලිම් පල්ලියක් වෙතින් වසර 33 ක කල්බදු වගකීමක් ලෙස ලබාගෙන තිබූ අතර මේ සඳහා මාසික කල්බදු

වාරිකය රු.මිලියන 22.28 ක් විය. මේ සඳහා අදාළ අරමුදල් සපයා ගැනීමේදී මෙම ඉඩමේ අයිතිකරු එරාවුර් නගර සභාව බව හඟවමින් සිදුකර තිබුණි.

(ඌ) එරාවුර් නගර සභාවට නිත්‍යානුකූලව අයත් නොවන ඉඩමක් තුල පුස්තකාල ගොඩනැගිල්ලක් සහිත සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදිකිරිම සඳහා සැලසුම් සකස් කර තිබුණි. කෙසේ වුවද සභාව විසින් පළමු ගොඩනැගිලි සැලැස්ම වෙනස් කරමින් පිරිවැය රු. මිලියන 117 කට වෙනත් සැලැස්මක් සකසා ඉදිරිපත් කර තිබුණු අතර මේ සම්බන්ධයෙන් නිරීක්ෂණ පහත දැක්වේ.

i. නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය විසින් මේ සඳහා අවශ්‍ය අරමුදල් සැපයීමට එකඟ වී තිබුණද සභාව විසින් කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා තනි ගොඩනැගිලි සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

ii. අමාත්‍යාංශය විසින් එකඟ වූ අරමුදල් වලින් රු.මිලියන 20 ක් 2016 වර්ෂයේදී නිදහස් කර තිබුණි. කෙසේ වුවද මෙම මුදල් ගොඩනැගිල්ලේ බිම් මහලේ කොටසක් ඉදිකිරිම සඳහා වෙනම කොන්ත්‍රාත්තුවක් වෙනුවෙන් ලබා දී තිබුණි.

iii. මෙම ගොඩනැගිල්ලේ බිම් මහලේ ඉදිකිරීම් 2017 සැප්තැම්බර් 04 දින වන තෙක් නිමකර නොතිබූ නමුත් සභාව විසින් ප්‍රමාණ පත්‍ර, වැඩ නිම කිරීමේ වාර්තා වැනි ලේඛන සාවද්‍ය ලෙස පිළියෙළ කර අදාළ සම්පූර්ණ වැඩ 2016 දෙසැම්බර් 31 දිනට පෙර නිමකර තිබූ බවට මඩකලපුව කලාප අධ්‍යාපන කාර්යාලයේ ඉංජිනේරුවරයා විසින් වැඩ නිමකළ බවට සහතිකය ලබා දී තිබුණි.

iv. මෙම ගොඩනැගිල්ලේ බිම් පිරවීමේ කාර්යයේදී කොන්ත්‍රාත්කරු විසින් සත්‍ය වශයෙන්ම පිරවීම් සිදු කර තිබුණේ ඝන මීටර් 400.42 ක ප්‍රමාණයක් වුවත් ඝන මීටර් 980.80 ක ප්‍රමාණයක් පිරවූ බවට සලකමින් සභාව විසින් අදාළ කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් සිදුකර තිබුණි. මේ හේතුවෙන් රු. 1,176,760 ක මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි.

v. කොන්ත්‍රාත්කරු විසින් ඝන මීටර් 66.04 ක ප්‍රමාණයේ බිම් සැකසීම සිදු කර තිබුණි. එසේ වුවද ගෙවීම් කිරීමේදී ඝන මීටර් 93.75 ක් වෙනුවෙන් ගෙවිම්කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් රු. 387,980 ක අධි ගෙවීමක් කොන්ත්‍රාත්කරු වෙත සිදුකර තිබුණි.

vi. මෙම කොන්ත්‍රාත්තුව සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය හා මධ්‍යම පරිසර අධිකාරිය යන ආයතන වල පූර්ව අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(එ) පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලිංගනගර් මාර්ගය ඉදිකිරිම සඳහා 2017 වර්ෂයේදී රු. 4, 756, 024 වටිනාකමකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

i. මෙවැනි ඉදිකිරීමේ ව්‍යාපෘති වෙනුවෙන් ජාතික තරඟකාරී මිල කැඳවීම් ක්‍රමය හෝ සීමිත ජාතික තරඟකාරී මිල කැඳවීම් ක්‍රමය අනුගමනය කල යුතු නමුත් දෙපාර්තමේන්තුව විසින් වෙළඳපල මිල කැඳවුම් ක්‍රමය මේ සඳහා අනුගමනය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇගයීමට ලක්වූ අවම වෙළඳපල මිල ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරු වෙනුවට ප්‍රතිචාර දැක්වූ එක් කොන්ත්‍රාත්කරුවාගේ මිල පදනම් කරගෙන කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

ii. ප්‍රමාණපත්‍රයේ 1.4 ඡේදය අනුව මි.මී.130 ක් ඝනකම වූ කොන්ක්‍රීට් ස්ථරයක් රු. 3,267,641 කට ඉදිකිරීමට නියමිතව තිබුණි. කෙසේ වුවද භෞතික පරික්ෂාවේදී අනාවරණය වූ පරිදි මි.මී 101.5 ක් වූ සාමාන්‍ය ඝණකමෙන් අදාළ කොන්ක්‍රීට් ස්ථරය ඉදිකර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් රු. 614,498 ක් වූ අධිගෙවිමක් සිදුකර තිබුණි.

iii. මෙම කොන්ත්‍රාත්තුවට අදාළ වැඩ නිම කිරීමේ වාර්තාවට අනුව එහි ප්‍රමාණපත්‍රයේ සඳහන් රු. 102,065 ක් වූ අංක 02 වැඩ අයිතමය හැර අනෙක් කොටස සම්පූර්ණ කර තිබුණි. කෙසේ වුවද කොන්ත්‍රාත්කරුගෙන් ලබාගෙන තිබු රු. 217,140 වටිනා කාර්ය සාධන බැඳුම්කර මඟින් එහි අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.2 වගන්තියට අනුව ප්‍රසම්පාදන කමිටුව ස්ථාපිත කල වහාම තාක්ෂණික ඇගයීම් කමිටුව ස්ථාපිත කල යුතු වන අතර තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ටෙන්ඩර් ලියවිලි පිළියෙළ කිරීම පිණිස ප්‍රසම්පාදන කමිටුව වෙත අවශ්‍ය සහයෝගය ලබා දිය යුතුය. කෙසේ වුවද ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී වටිනාකම රු. 4,162,808 වූ නූල් සහ ඩයි වර්ග මිලදී ගැනීම වෙනුවෙන් ප්‍රසම්පාදන කටයුතු ඉටු කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂයේදී රු. 219,937,500 ක කොන්ත්‍රාත් වටිනාකමකට අමරවායල් තෙන්නමරන්වාඩිය මාර්ගය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. අවසන් බිල් පත්‍රයට අනුව වටිනාකම රු. 39,142,740 ක් වූ ඝනමීටර් 6,523.79 ක් වන මි.මී 150 ක ඝණකම සහිත රු.4,500,000 ක් වටිනා ABC ස්ථරයක් දැමිය යුතුව තිබුණි. මෙම මාර්ග පිලිබඳ තාක්ෂණික වශයෙන් සිදුකල භෞතික පරික්ෂාවේදී අනාවරණය වූ පරිදි මෙම මාර්ගය සඳහා යොදා තිබූ සාමාන්‍ය ඝනකම මි.මී 118.75 ක කොන්ක්‍රීට් ස්ථරයක් ABC ස්ථරයේ සාමාන්‍ය ඝනකම මි.මී 93.33 ක් හා හෙවත් ඝන මීටර් 3461.58 වී තිබූ බව අනාවරණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස දෙපාර්තමේන්තුව විසින් රු. 19,149,240 ක අධි ගෙවීමක් සිදු කර තිබුණි.

ii. පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අමරවායල් තෙන්න මාවඩේ මාර්ගයේ මිලිමීටර් 50 ක කොන්ක්‍රීට් ස්ථරයක් ගල් දමා ඉදි කිරීමට කොන්ත්‍රාත්කරුට රු.73,059,981 ක් ගෙවා තිබුණි. කෙසේ නමුත් මිලිමීටර් 41.67 ක කොන්ක්‍රීට් ස්ථරයක් මත රු.64,611,197 ක් කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතුව තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් කොන්ත්‍රාත්කරුට රු.8,448,784 ක් මේ සම්බන්ධයෙන් වැඩිපුර ගෙවා තිබුණි.

(ඕ) නැගෙනහිර පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් PSDG ප්‍රතිපාදන යටතේ මහඔය ප්‍රදේශයේ දිස්ත්‍රික් කෘෂි ව්‍යාපෘති බෙදාහැරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේදී රු. 10,405,053 ක් වූ වටිනාකමට කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. මෙහි ගෙවීම් බිල්පත් අනුව මෙම කොන්ත්‍රාත්තුවේ මි.මි 10 ක් වූ කිලෝ ග්‍රෑම් 1749.872 සහිත කොන්ක්‍රීට් ස්ලැබ් එකට වානේ කාප්පයක් ඉදිකිරීම සඳහා රු. 402,470 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද කොන්ත්‍රාත්කරු විසින් මේ සඳහා කිලෝ ග්‍රෑම් 1629.979 ක් පමණක් භාවිතා කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් රු. 27,575 ක අධි ගෙවීමක් කොන්ත්‍රාත්කරුට සිදුකර තිබුණි.

## 4.11 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

### (අ) පාසල් කාර්ය මණ්ඩලය

-------------------------

I. නැගෙනහිර පළාතේ කල්මුනේ, සමන්තුරේ, මඩකලපුව හා පද්දිරිප්පු කලාප අධ්‍යක්ෂක කාර්යාල බල ප්‍රදේශවල ගුරුවරුන් 518 ක් අතිරික්තව පැවතුණි. එසේම අක්කරෙයිපත්තු, මඩකලපුව මධ්‍යම. මඩකලපුව බටහිර, කල්කුඩා, කින්නියා, මුතූර් සහ ත්‍රිකුණාමලය කලාප අධ්‍යාපන කාර්යාල බල ප්‍රදේශවල ගුරු පුරප්පාඩු 1394 ක් පැවතුණි. මේ අනුව ගුරුවරුන් ස්ථාන මාරු කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

II. අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 1998/23 හා 1998 ජුලි 06 දිනැති චක්‍රලේඛයේ 06 ඡේදය අනුව සුදුසුකම්ලත් විදුහල්පති වරුන් පාසලට අනුයුක්ත කරන තෙක් වැඩ බලන විදුහල්පතිවරුන් අනුයුක්ත කල හැකිය. කෙසේ වුවද නැගෙනහිර පළාතේ පාසල් වල ගුරු සේවයට අයත් ගුරුවරුන් 255 දෙනෙකු එලෙස වැඩ බැලීමේ පදනම යටතේ අනුයුක්ත කර තිබුණු නමුත් විදුහල්පති සේවයට අළුතින් බඳවාගත් 215 දෙනෙකු සිටියදී මෙසේ අනුයුක්ත කිරීම් කර තිබුණි.

III. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 2007/20 හා 2007 දෙසැම්බර් 13 දිනැති චක්‍රලේඛය පරිදි පාසලක වසර 8 ක් අඛන්ඩව සේවය කර ඇති ගුරුවරුන් ස්ථාන මාරුවීම් කල යුතු වේ. එසේ වුවද නැගෙනහිර පළාතේ ගුරු සේවයට අයත් ගුරුවරුන් 523 දෙනෙකු හා විදුහල්පති සේවයට අයත් 24 දෙනෙකු 2018 අප්‍රේල් 15 දින වන විට වසර 10 සිට 18 දක්වා කාලපරාසයක් තුල එලෙස සුදුසු පාසල්

සඳහා ස්ථාන මාරු කිරීම් සිදු නොකර අඛණ්ඩව එම පාසල් වලම සේවයේ යෙදී තිබුණි.

IV. පළාත් පාසල් වල ගුරුවරුන් ජාතික පාසල් වලටත් ජාතික පාසල්වල ගුරුවරුන් පළාත් සභා පාසල් වලටත් මාස 3 ක කාලයක් උපරිමයකට යටත්ව තාවකාලික පදනමින් අදාළ පළාත් අධ්‍යක්ෂකවරුන්ට ස්ථාන මාරු කිරීම් සිදු කිරීමට හැකියාව ඇතත් ජාතික පාසල්වලට අනුයුක්තව සිටි ගුරුවරුන් 22 දෙනෙකු හා පළාත් සභා පාසල් වලට අයත් ගුරුවරුන් 06 දෙනෙකු වසර 2 කට වැඩි කාලයක සිට එලෙස පළාත් පාසල් හා ජාතික පාසල්වලට අයත් පාසල් වලට ස්ථාන මාරු කිරීම් සිදුකර තිබුණි.

V. කල්මුණේ කලාප අධ්‍යාපන කාර්යාල බලප්‍රදේශයේ පාසල් වලට අයත් ප්‍රාථමික ගුරුවරුන් 29 දෙනෙකු එම අධ්‍යාපන කලාපයේ ප්‍රාථමික ගුරු පුරප්පාඩු 98 ක් තිබියදී ද්විතික මට්ටමේ පන්තිවල ඉගැන්වීම් කටයුතු වල නියුක්තව සිටින බව නිරීක්ෂණය විය.

VI. කල්මුනේ කලාප අධ්‍යාපන කාර්යාල බලප්‍රදේශයේ විශේෂ අධ්‍යාපන විෂය සඳහා පුරප්පාඩු 19 ක් තිබියදී මෙම අධ්‍යාපන කලාපයේ හා මඩකලපුව මධ්‍යම අධ්‍යාපන කලාපයේ පාසල් වල විශේෂ අධ්‍යාපන විෂය සඳහා පුහුණුව ලත් ගුරුවරුන් 11 දෙනෙකු විශේෂ අධ්‍යාපන නොවන හෝ වෙනත් විෂයන් ඉගැන්වීම් සඳහා අනුයුක්ත කර තිබුණි.

(ආ) සෞඛ්‍ය අංශයේ කාර්යමණ්ඩලය

---------------------------------

I. හෙද නිලධාරින් හා පවුල් සෞඛ්‍ය සේවිකාවන් 32 දෙනෙකු හා 23 දෙනෙකු කල්මුනේ හා ත්‍රිකුණාමලය කලාප වල 2017 දෙසැම්බර් 31 දිනට සේවයේ දී සිටි නමුත් මඩකලපුව හා අම්පාර කළාප වල මෙම නිලධාරීන් පිලිවෙලින් 08 ක් හා 31 වශයෙන් පුරප්පාඩු පැවතුණි. එසේ වුවද මෙම අතිරික්ත හා පුරප්පාඩු නිලධාරින් එම කලාපය තුල තුලනය වන පරිදි අනුයුක්ත කිරීමට කටයුතු කර නොතිබුණි.

II. සාම්පූර් ප්‍රාදේශීය රෝහල්වල දන්ත වෛද්‍ය, හෙද නිලධාරින්, උපස්ථායකයින් හා පවුල් සෞඛ්‍ය නිලධාරීන් 10 දෙනෙකුගේ තනතුරු වල පුරප්පාඩු පැවතියදී එම නිලධාරින් 03 දෙනෙකු පමණක් අනුයුක්ත කර තිබුණි.

5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

----------------------------------------

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

පළාත් මුදල් රීති වල (PER) 258 (3) වගන්තිය ප්‍රකාරව, මුදල් වර්ෂයක් සඳහා පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පසු වර්ෂයේ මාර්තු 31 ට පෙර විගණනය සඳහා ඉදිරිපත් කල යුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2018 මැයි 01 දිනදී දින 30 ක ප්‍රමාදයකිනි.

5.2 අනෙකුත් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2018 අප්‍රේල් 18 දිනට පළාත් සභාවේ අනෙකුත් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අදාළ ප්‍රගතිය පහත දැක්වේ.

| | ගිණුම් වර්ගය | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කරන ලද ගිණුම් සංඛ්‍යාව | 2018 අප්‍රේල් 18 දිනට ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| i. | විසර්ජන ගිණුම් | 34 | 32 | 02 |
| ii. | ආදායම් ගිණුම් | 01 | 01 | - |
| iii. | පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 34 | 32 | 02 |
| iv. | වාණිජ අත්තිකාරම් ගිණුම් | 06 | 01 | 05 |
| v. | අරමුදල් ගිණුම් | 02 | 01 | 01 |
| vi. | ප්‍රඥප්ති ගිණුම් | 03 | 01 | 02 |
| | එකතුව | 80 | 68 | 12 |

(ආ) 2010 අංක 01 දරණ පෙර පාසල් අධ්‍යාපන කාර්යාංශ ප්‍රඥප්තියේ 9 (2) වගන්තිය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා නැගෙනහිර පළාත් සභාවේ පෙර පාසල් අධ්‍යාපන කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන, 2018 ජූනි 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද,

2016 වර්ෂය සඳහා කාර්යාංශයේ මුල්‍ය ප්‍රකාශන මාස 15 ක ප්‍රමාදයකින් පසුව 2018 ජුනි 07 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ඈ) අදාළ ගිණුම් ප්‍රකාශන නියමිත පරිදි ඉදිරිපත් කිරීමට හැකිවනු පිණිස ආණ්ඩුකාරවරයාගේ නීති ප්‍රතිපාදනයන් සංශෝධනය කිරීමට නොහැකි වීම හේතුවෙන් නැගෙනහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ භාර අරමුදලේ 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ මුල්‍ය ප්‍රකාශන පළාත් මුල්‍ය රීති 258.3 ප්‍රකාරව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) 2018 ජනවාරි 18 දිනැති අංක පීටී/01/2018 දරන පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව, විසර්ජන ගිණුම් 2018 මාර්තු 31 දිනට පෙර විගණනයට ඉදිරිපත් කල යුතු විය. කෙසේ වුවද, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් මාස 2 ක ප්‍රමාදයකින් පසුව විසර්ජන ගිණුම් 2018 ජුනි 04 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

5.3 තිරසාර සංවර්ධනය

---------------------

2017 අංක 19 දරණ තිරසාර සංවර්ධන ඉලක්කය පිලිබඳ පනතට අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම තිරසාර සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීම පිණිස කටයුතු කල යුතු අතර එහිදී ක්‍රියාත්මක වැඩසටහන්වල ඉලක්කය කරා ලඟා වී ඇත්ද යන්න මැන බැලීමට අවශ්‍ය නිර්ණායක හා එසේ ඉලක්ක කරා ලඟා නොවීම නිසා ඇතිවන පරතරයන් හඳුනා ගැනීම අවශ්‍ය වේ. කෙසේ වුවද නැගෙනහිර පළාත් සභාවට අයත් පළාත් සභා ආයතන 34 ක් විසින් තිරසාර සංවර්ධන වැඩසටහන යටතේ තම ඉලක්කයන් හඳුනා ගැනීමට සමාලෝචිත වර්ෂය තුල කටයුතු කර නොතිබුණි. තවද, 2030 වර්ෂය වන විට ලඟා වීමට නියමිත වන තිරසාර සංවර්ධන ඉලක්කයන් පිලිබඳ අදාළ ආයතන විසින් ලබා දී ඇති දැනුවත් භාවය පිලිබඳ සෑහීමකට පත්විය නොහැකි විය.

5.4 පරිසර ආරක්ෂණය

---------------------

අංක 47 හා 1980 පරිසර පනතට අනුව වාහන ඉන්ධන පිරවුම්හල්, සිමෙන්ති කර්මාන්තයේ යෙදෙන ආයතන, වඩු කාර්මික ආයතනය, කඩ සාප්පු, ගරාජයක් හා හාල් මෝල් වැනි ආයතන විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගත යුතුය. කෙසේ වුවද ත්‍රිකුණාමලය නගර සභාව විසින් එම පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා නොගත් ආයතන 109 කට අදාළ බලපත්‍ර ලබා දී තිබුණි.

5.5 ක්‍රියාකාරී සැලැස්ම

--------------------

පළාත් සභා යටතේ ක්‍රියාත්මක වන අමාත්‍යාංශ 2 ක් දෙපාර්තමේන්තු 9 ක් හා ව්‍යවස්ථාපිත ආයතන 3 ක් විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

5.6 විගණන හා කළමනාකරණ කමිටු.

-----------------------------------

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජ්/2009 (1) දරන කළමනාකරණ හා විගණන චක්‍රලේඛයේ 06 වගන්තිය ප්‍රකාරව විගණන හා කලමනාකරණ කමිටු අවම වශයෙන් කාර්තුවකට එක් වතාවක් හෝ රැස්විය යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ පළාත් දෙපාර්තමේන්තු 10 ක් විසින් සමාලෝචිත වර්ෂයේදී විගණන හා කලමනාකරණ කමිටු 4 ක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

5.7 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

පළාත් සභාවේ විෂය පථය යටතට එන දෙපාර්තමේන්තු 08 ක් හා ව්‍යවස්ථාපිත ආයතන 3 ක් විසින් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය පරිදි 2017 වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

5.8 අභ්‍යන්තර විගණනය

-----------------------

පළාත් විගණන දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙළ කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණන පරීක්ෂාවන් 429 ක් සිදු කළ යුතු අතර ආයතන 34 ක් සම්බන්ධයෙන් කල යුතුව තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුව වෙනුවෙන් රු.20,237,323 ක් වියදම් කර තිබූ නමුත් මෙම කාල සීමාව තුල විගණන පරීක්ෂාවන් 278 ක් පමණක් සිදු කර තිබුණි. තවද පළාත් විගණන දෙපාර්තමේන්තුව විසින් නැගෙනහිර පළාත් සභාවට අයත් ආයතන 18 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ විගණන කටයුතු සිදුකර නොතිබුණි.

5.9 පසුගිය විගණන වාර්තා වලින් පෙන්වා දෙන ලද නොවිසඳුන කරුණු

---

(අ) පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ මූලික කාර්යය භාර්යයන් අතරින් එක් ප්‍රධාන කාර්යය භාර්යයක් වන්නේ නැගෙනහිර පළාතේ ඇති පළාත් සභා හා මධ්‍යම ආණ්ඩුවට අයත් ආයතන වෙනුවෙන් උපදේශක සේවාව ලබා දීම වේ. එසේ වුවද 2016 හා 2017 වර්ෂ වලදී කාර්යාල ගොඩනැගිල්ලක් තැනීමේදී උපදේශන සේවාවක් සැපයීම වෙනුවෙන් රු. මිලියන 6.3 ක මුදලක් මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලැබී තිබුණු නමුත් එම මුදල පළාත් භාණ්ඩාගාරයට යැවීම වෙනුවට ප්‍රධාන ලේකම්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරුසේවා) හා අධ්‍යක්ෂක ගොඩනැගිලි දෙපාර්තමේන්තුව යන නිලධාරින් ඇතුළු නිලධාරින් 21 දෙනෙකු අතර මුදල් බෙදාගෙන තිබුණි. අනතුරුව මෙවැනි ඉදිකිරීමක් සම්බන්ධයෙන් උපදේශන සේවා සැපයීම සඳහා ප්‍රමාණවත් විශේෂඥයන් පිරිසක් දෙපාර්තමේන්තුවේ නොසිටීම හා වසර දෙකකට වඩා වැඩි කාලයක් මෙම ඉදිකිරිම ප්‍රමාද වීම යන හේතු නිසා මඩකලපුව දිස්ත්‍රික් ලේකම් විසින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලද කොන්ත්‍රාත්තුව අත්හිටුවා තිබුණි.

(ආ) කින්නියා ප්‍රාදේශීය සභාවේ 2013 මුදල් වර්ෂයට අදාලව රු. 2,106,258 ක් වටිනා ගෙවීම් වවුචර 68 ක් හා 2014 වර්ෂයට අදාලව රු. 3,253,657 ක් වටිනා ගෙවීම් වවුචර 44 ක් නැතිවී තිබුණි. කෙසේ වුවද ගෙවීම් වවුචර් නැතිවීම පිලිබඳ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා මඟින් විගණකාධිපතිවරයාට පිටපත් මඟින් පළාත් භාණ්ඩාගාරයට දැනුම් දීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රමාණවත් ඇපකරුවන් ලබා ගැනීමෙන් තොරව 2010 හා 2011 වර්ෂ තුලදී පළාත් සභා මන්ත්‍රී වරුන්ට රු. 4,600,000 ක් වූ ණය මුදල් පළාත් සභාව විසින් ලබා දී තිබුණු අතර 2018 ජූනි 30 දින වන විට ඔවුන්ගෙන් රු. 1,219,157 ක මුදලක් අයකර ගත යුතු විය. කෙසේ වුවද ණය අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිමය පියවර මේ සඳහා ගෙන නොතිබුණි.

(ඈ) පළාත් සභාවේ හිටපු මන්ත්‍රීවරුන් විසින් 2008 සිට 2011 කාල ඡේදය තුල ලැප්ටොප් 37 ක් හා ෆැක්ස් යන්ත්‍ර 37 ලබා ගෙන තිබුණු අතර 2012 ජුනි 27 දින පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසු ඉන් ලැප්ටොප් 12 ක් හා ෆැක්ස් යන්ත්‍ර 12 ක් පමණක් පළාත් සභාවට ආපසු භාර දී තිබුණි. කෙසේ වුවද රු. 4,524,250 ක් වටිනා ඉතිරි ලැප්ටොප් 25 ක් හා

ෆැක්ස් යන්ත්‍ර 25 ක් 2018 ජුනි 30 දක්වා ආපසු භාර දී නොතිබුණි. කෙසේ වුවද මේ සම්බන්ධයෙන් කිසිදු පියවරක් 2018 ජුනි 30 දක්වා ගෙන නොතිබුණි.

(ඉ) 2008 වර්ෂය තුලදී රැකියා නොමැති තරුණයන්ට කොරියානු භාෂා පංති පැවැත්වීම සඳහා ප්‍රධාන අමාත්‍යවරයාගේ හිටපු ලේකම් වරයාට අත්තිකාරමක් ලෙස රු. 2,000,000 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද අපේක්ෂා කළ පරිදි ඉහත සඳහන් පංති පවත්වා නොතිබූ අතර ගෙවන ලද අත්තිකාරම් මුදල 2018 ජුනි 30 දක්වා නිරවුල් කර නොතිබුණි.

(ඊ) බදු හා කුලී අයකර ගැනීම පිණිස තඹලගමුව ප්‍රාදේශීය සභාව විසින් ආදායම් එකතු කිරීමේ නිලධාරින් වෙත මුදල් ලැබීම් පත්‍රිකා පොත් නිකුත් කර තිබුණි. කෙසේ වුවද 2013 හා 2014 වර්ෂ වලදී එම ආදායම් රැස්කළ නිලධාරින් විසින් මුදල් ලැබීම් පත්‍රිකා පොත් 9 ක මුදල් එකතුව සභාව වෙත පියවා නොතිබුණි. අනතුරුව, එම පොත් 9 න් මුදල් ලැබීම් පත්‍රිකා පොත් 2 කට අදාළ වූ රු. 160,900 ක මුදලක් පමණක් අදාළ නිලධාරින් විසින් සභාව වෙත පියවා තිබුණි. කෙසේ වුවද මේ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට විරුද්ධව මේ දක්වා විනයානුකූල කටයුතු කර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන සම්බන්ධයෙන් වූ දුර්වලතා විටින් විට පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයාගේ අවධානය පිණිස යොමුකර ඇත. විශේෂ අවධානය යොමුකළ යුතු පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පහත දැක්වේ.

| පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණය |
|---|---|
| (අ) ගිණුම්කරණය | මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු නොකිරීම. |
| (ආ) ස්ථාවර වත්කම් උපයෝජනය | i. භාණ්ඩ සමීක්ෂණ හා සමීක්ෂණ මණ්ඩලය විසින් කෙරෙන නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම.<br>ii. නිෂ්ක්‍රිය වත්කම් අපේක්ෂිත අරමුණු වෙනුවෙන් යොමු නොකිරීම. |
| (ඇ) ආදායම් පරිපාලනය | හිඟ මුද්දර ගාස්තු, කුලී හා බදු අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර නොගැනීම. |

| | | |
|---|---|---|
| (ඇ) | කොන්ත්‍රාත් පාලනය | ප්‍රමාදයකින් තොරව කොන්ත්‍රාත් වැඩ නිම කිරීම නුබුන්වත් අලාභ අයකර ගැනීම හා අඩුපාඩු නිවැරදි කිරීම. |
| (ඉ) | මානව සම්පත් කලමනාකරණය | සෞඛ්‍ය කාර්යමණ්ඩලයේ හා පාසල් ගුරුවරුන් සඳහා විධිමත් ස්ථාන මාරු ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම. |